

## ඉදිරි ජනාධිපතිවරණයට පෙර සිදුවන්නේ කුමක්ද?

# ලාම්පු කලගෙඩි සෙල්ලම රනිල් - සජිත් කසාදය ද?

### නව වටයකින් එන ජනමත විචාරණ ප්‍රෝඩාව

මෙම වසරේ සැප්තැම්බර් මාසයේදී කැඳවීමට නියමිත ජනාධිපතිවරණය නොපවත්වා සිටීම සඳහා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාවක් ආණ්ඩුවේ පාර්ශවය අතර කතාබහට ලක්වී ඇති බව දැන් රහසක් නොවේ. එසේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා වන ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර අනුමැතියට අමතරව ජනමත විචාරණයක් මගින් මහජනයාගේ අනුමැතිය ද ලබා ගත යුතු බව පොදු පිළිගැනීම වේ. එහෙත් 1978 ව්‍යවස්ථාව සම්මත කරන අවස්ථාවේදී ඉතා කූඨ ලෙස 'එන්ට්‍රන්ජ්' හෙවත් ජනමත විචාරණයකින් තොරව සංශෝධනය කළ නොහැකි වගන්ති ලැයිස්තුවෙන් 4 වැනි වගන්ති ඉවත් කිරීම තුළ පොදු සම්මතයට වෙනස් මතයක් ද ඉදිරිපත් වේ. ඒ අනුව විධායක ජනාධිපතිවරයාට බලය පැවරෙන වගන්තිය සංශෝධනය කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය නොවන බවට තර්කයක් ගොඩනැගීමේ හැකියාව ලැබී ඇත.

### 1978 ව්‍යවස්ථා සංශෝධනයේ කූඨ ක්‍රියාව

එදා 1978 නව වස්ථාව සම්මත කරන අවස්ථාවේ හැන්සාඩ් වාර්තාවලට අනුව එවකට ආගමැති ආර්. ප්‍රේමදාස මහතා ජනමත විචාරණයකින් තොරව සම්මත කළ නොහැකි වගන්ති ලැයිස්තුවට 4 වැනි වගන්තිය ද ඇතුළත් කර යෝජනාව ඉදිරිපත් කළ බව ඉතා පැහැදිලිය. නමුත් සිංහල භාෂාවෙන් ඉදිරිපත්කළ එම යෝජනාව දේවනායගම් මන්ත්‍රීවරයා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ස්ථිර කිරීමේදී 4වැනි වගන්තිය නොමැතිව එම වගන්ති ලැයිස්තුව නැවත කියවනු ලැබීය. අවසානයේදී පාර්ලිමේන්තුවේ හැන්සාඩ් අංශය විසින් සැලකිල්ලට ගනු ලබන්නේ ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කළ යෝජනාවය. ඒ අනුව වර්තමානයේදී 4වැනි වගන්තියට අදාල ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය නොවන බවට තර්කයක් ගොඩනැගීමට හැකියාව ලැබී ඇත.

### එම කූඨ ක්‍රියාවලිය මගින් 13 සම්මත කළ හැටි

කෙසේ වෙතත් පසුකාලීනව 13 වැනි සංශෝධනය සම්මත කිරීමේදී ජනමත විචාරණයක් අවශ්‍ය නොවන්නේ එදා දේවනායගම් මන්ත්‍රීවරයාට සිදු වූ අතපසුවීම සහ පාර්ලිමේන්තු හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ අවසන් නිගමනයට අනුව බව අනාවරණය විය. ඒ අනුව එසේ 4වැනි වගන්තිය සංශෝධනය කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය නොවන ආකාරයට ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පැනවෙන්නේ යම් දීර්ඝ කාලීන අරමුණක් සහිතව බවට තර්කයක් ගොඩනැගීමේ හැකියාව ඇත. එදා ජනමත විචාරණයකින් තොරව 13 වැනි සංශෝධනය සම්මත කිරීමට හැකි වූ ආකාරයට මෙදා 13 වැනි සංශෝධනය එසේම තිබියදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම යනු බෙදුම්වාදී බලවේගවල දීර්ඝකාලීන ප්‍රාර්ථනාවක් බව ඉතා පැහැදිලිය.

### බෙදුම්වාදීන්ගේ යටි අරමුණු සහ විධායක ජනාධිපති ක්‍රමය

එදා 13 වැනි සංශෝධනයට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු අනුව ජනමත විචාරණයකින් තොරව එම සංශෝධනය සම්මත කිරීමට හැකි වන්නේ විධායක ජනාධිපතිගේ බලතල නිසාය. ඒ අනුව 13 වැනි සංශෝධනය එසේම තිබියදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම මගින් බෙදුම්වාදී බලවේග සතුටට පත්වන බවට ඉතා සාධාරණ තර්කයක් ගොඩනැගිය හැක. එසේ වුවත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම යනු වසර 30කට අධික කාලයක් දේශපාලන වේදිකාවල තොරොම්බල් කළ සටන් පාඨයකි විධායක ජනාධිපතික්‍රමය මගින් එක් පුද්ගලයෙකු අතට ලැබෙන අත්තනෝමතික බලය රටට වැඩදායක නොවන බවට පළමුව සටන් පාඨය අතට ගනු ලබන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක විසිනි. නමුත් එදා සිට අද දක්වා වසර 30ක්

ජනාධිපතිවරුන් විසින් එම පොරොන්දුව ලබා දුන්නද එය ඉටු නොකළ බව පමණක් නොව ඉටු කිරීමට උත්සාහයක් හෝ නොගත් බව දැන් ඉතා පැහැදිලිය. එම නිසා වර්තමාන ජනාධිපතිවරයා විසින් එම මියගිය සටන් පාඨයට නැවත පරණදීම මගින් යම් දේශපාලන කැළඹීමක් ඇති කිරීමේ යටි අරමුණ කුමක්දැයි කල්පනා කිරීම ජාතිකවාදී බලවේගවලට ඉතා වැදගත්වේ.

## ජේ.ආර්. ජයවර්ධන ජයගත් හැටි

එම දීර්ඝ පූර්විකාව අවශ්‍ය වන්නේ ජනමත විචාරණ ක්‍රියාවලිය තුළ පවතින සංකීර්ණ තත්ත්වය සහ ඊට අදාළ දේශපාලන අරමුණු තේරුම් ගැනීම සඳහාය. එදා ජේ.ආර් ජයවර්ධන මහතා 1977 මැතිවරණයෙන් එදා පැවති ආසන 160න් 140ක් ලබා ගැනීමට සමත් විය. එසේ හයෙන් පහක අසාමාන්‍ය බලයක් ලබා ගැනීමට ඔහු සමත් වන්නේ 70-77 ආණ්ඩුව පිළිබඳව ජනතාව අතර පැවති හෝ නිර්මාණය කළ අප්‍රසාදය නිසා බව ඉතා පැහැදිලිය. ඊට අමතරව එදා සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙකු වූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා විසින් එදා පැවති දේශපාලන සන්ධානයෙන් වාමාංශික පක්ෂ පිටුවහල් කිරීම සඳහා දියත් කළ මෙහෙයුම සාර්ථක වීමද එම මහා පරාජයට හේතු වූ බව පසුව කතාබහට ලක් විය. එවැනි තත්ත්වයක් තුළ ජේ.ආර්. ජයවර්ධන අගමැතිවරයාගේ ප්‍රතිවාදියා වූ සිරිමාවෝ බණ්ඩාරනායකට ලබා ගත හැකි වන්නේ ආසන 8ක් පමණි. ඒ අනුව එදා ආසන 17ක් ලබාගත් දෙමළ එක්සත් පෙරමුණට විපක්ෂ නායකකම ලබා ගැනීමට හැකි විය.

## 1978 නව ව්‍යවස්ථාවට පෙර ජේ.ආර්. විධායක ජනපති වූ හැටි

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ පාලන කාලය තුළ උතුරේ බෙදුම්වාදී ව්‍යාපාරයේ නැගිටීම මෙන්ම දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ වර්ධනයද ඔහුගේ බලයට ප්‍රබල අභියෝගයක් විය. ඒ අනුව එදා 1977 දී අගමැතිවරයා ලෙස පත් වූ පුද්ගලයා මහජනයාගේ අනුමැතියකින් හෙවත් ජන වරමකින් තොරව ඉතා බලවත් විධායක ජනාධිපතිවරයකු බවට පත්වන්නේ ඉතා සූක්ෂම ව්‍යවස්ථා සංශෝධනයක් මගිනි. ඔහු විසින් ඇත්ත වශයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය සඳහා ප්‍රතිපාදන සලසනු ලබන්නේ 1978 නව වස්ථාව සම්මත කිරීමට පෙර 1972 ව්‍යවස්ථාවට දෙවන සංශෝධනයක් ලෙස එම ව්‍යවස්ථාවේ 28 වැනි වගන්තිය සංශෝධනය කිරීම මගිනි. ඒ මගින් ඒ වන විට අගමැතිවරයා ලෙස කටයුතු කරන පුද්ගලයා ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ පුද්ගලයා ලෙස ප්‍රකාශයට පත් විය. ඊට මාස 10කට පසුව ඉදිරිපත් කළ 1978 නව ව්‍යවස්ථාවේ 160 වගන්තිය මගින් එසේ ජනාධිපතිවරයා ලෙස නාමකරණයට ලක් වූ පුද්ගලයා රටේ ජනතාව විසින් තෝරා පත්කරගත් ජනාධිපතිවරයා බවට ප්‍රකාශයට පත් වූ අතර ඔහුට 1978 පෙබරවාරි 4 දින සිට වසර 6ක කාලයක් සඳහා එම බලය භුක්ති විඳීමට ප්‍රතිපාදන සැලසුණි.

## 1982 දී විධායක බලය තහවුරු කරගත් හැටි

එසේ ජනවරමකින් තොරව විධායක ජනාධිපති ධුරයට පත් වූ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට මුහුණ දීමට සිදුවූ ප්‍රධාන අභියෝගය වූයේ පාර්ලිමේන්තුව තුළ තමා සතු හයෙන් පහක බලය ආරක්ෂා කර ගැනීමය. ඒ සඳහා කළ යුත්තේ පවතින පාර්ලිමේන්තුවේ කාලය තවත් වසර හයකට දීර්ඝ කර ගැනීමය. ඊට අමතරව නියමිත කාලයට එනම් 1984 දී පළමු ජනාධිපතිවරණය පැවැත්වීම මගින් නැවත බලයට පත්වීමට එරෙහිව පැන නැගිය හැකි බාධක පූර්වගාමීව ඉවත් කර ගැනීම අවශ්‍ය වේ. එනම් දේශපාලන අර්බුද උත්සන්න වීමට පෙර ජනාධිපතිවරණයක් පවත්වා වසර හයක් සඳහා බලය තහවුරු කර ගැනීමය. ඒ අනුව එම අභියෝග ජයගැනීම සඳහා ඔහු විසින් ව්‍යවස්ථා සංශෝධන 2ක් ඉදිරිපත් කරනු ලැබීය. ඒ අතරින් පළමුවැන්න වසර 4ක් ගත වූ පසුව ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා අවකාශය ලබා ගැනීම සඳහා වූ සංශෝධනයයි. ඒ අනුව 1984 දී පැවැත්වීමට නියමිත වූ ජනාධිපතිවරණය 1982 දී පැවැත්වීම සඳහා ප්‍රතිපාදන සලසන 1978 ව්‍යවස්ථාවට අදාළ 3 වන සංශෝධනය ඔහු විසින් සම්මත කරගනු ලැබීය.

## ලාම්පු කළගෙඩි සෙල්ලම

එම ක්‍රියාවලිය මගින් 1982 ඔක්තෝබර් 20 වැනි දින ජනාධිපතිවරණය පවත්වා 53% ජන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගැනීමට ඔහු සමත් විය. ඉන්පසුව තමා සතු හයෙන් පහක බලය ආරක්ෂා කර ගැනීම හෙවත් පවතින පාර්ලිමේන්තුව තවත් වසර හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම සඳහා වන ව්‍යවස්ථා සංශෝධනය හෙවත් 1978 ව්‍යවස්ථාවේ 4වැනි සංශෝධනය ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබීය. එම සංශෝධනය සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර කැමැත්තට අමතරව ජනමත විචාරණයක්ද අවශ්‍ය විය. ශ්‍රී ලංකාවේ පළමු ජනමත විචාරණය පැවැත්වීම සඳහා තත්ත්වයන් නිර්මාණය වන්නේ එම අවශ්‍යතාවය අනුවය. ඒ අනුව 1982 නොවැම්බර් 5 වන දින අදාල ව්‍යවස්ථා සංශෝධනයට පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව දෙසැම්බර් 12 වැනිදා ජනමත විචාරණය පවත්වනු ලැබීය.

## ජනමතයේ විකෘතිය තුළින් බලය තහවුරු කර ගැනීම

කෙසේ වෙතත් එදා පැවති ජනමත විචාරණය මගින් පොදු මහජනතාවගේ සැබෑ මතය ප්‍රකාශයට පත් නොවූ

බව ඉතා පැහැදිලි කරුණකි. මැතිවරණ දූෂණ පිළිබඳ වාර්තා නොසලකා හැරියද ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් ඡන්දය ප්‍රකාශ නොකිරීම බරපතල විකෘතියක් නොවේද? එදා රටේ ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව 8,145,015කි. නමුත් ලාම්පුව ලකුණට හෙවත් පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරනු ලැබුවේ 3,141,223 කි. ඊට විරුද්ධව කලගෙඩිය ලකුණට ඡන්දය ප්‍රකාශ කළ ප්‍රමාණය 2,605,983 ක් වූ අතර ප්‍රතික්ෂේප වූ ප්‍රමාණය 21,456 කි. අද පවතින දේශපාලන අර්බුදය සහ සමාජය තුළ දක්නට ලැබෙන බිඳවැටීම තුළ 2023 දී පැවැත්වීමට සිදුවිය හැකි ජනමත විචාරණයේ ප්‍රතිඵල මීට නොදෙවෙනි වන බවට සැකයක් නැත.

## විධායක ජනාධිපතික්‍රමය අහෝසි කිරීමේ ප්‍රෝඩාව

මූලික වශයෙන් එදා ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට ජනමත විචාරණයකින් තමා සතු හයෙන් පහක පාර්ලිමේන්තු බලය ආරක්ෂා කර ගැනීමට සිදුවන්නේ 1977 ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ විශේෂ බහුතර බලය ලබා ගැනීම සඳහා වන සම්භාවිතාව ඉතා අඩුවීම නිසාය. එම තත්ත්වය තුළ විවර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ යෝජනාව ගොඩගැනීම යනු තර්කානුකූල ප්‍රවේශයක් බවට විවාදයක් නැත. එහෙත් 13වැනි සංශෝධනය එසේම පවතින තත්ත්වයක් තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ අනතුර සැඟවීමට ආණ්ඩුවට පහසු වන්නේ නැත. ඊට අමතරව ජනාධිපතිවරණයට මුහුණ නොදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව ඉදිරිපත් වන්නේ ජනාධිපතිවරණය කල් දැමීම සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කිරීම දේශපාලන යථාර්ථයක් නොවන නිසා බවද ඉතා පැහැදිලිය. ව්‍යවස්ථා විශාරදයින්ට අනුව ඊට හේතු වන්නේ විධායක ජනාධිපතික්‍රමය අහෝසි කිරීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය නොවුනද ජනාධිපතිවරණය කල් දැමීම සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය වීමය. පවතින දේශපාලන යථාර්ථය තුළ ජනාධිපතිවරයා විසින් තම මාමාගේ සියලු ශිල්ප භාවිතා කළද එවැනි ප්‍රවේශයක් සාධාරණීකරණය කිරීම හෝ එම අභියෝගය ජයගැනීම පහසු නොවේ.

## ප්‍රෝඩාව යොදා ගැනීමට නොහැකිවීමේ හේතුව

කෙසේ වෙතත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම එකට ගැට ගැසූ ව්‍යවස්ථා සංශෝධනයක් තුළ අන්තර් කාලීන ප්‍රතිපාදනයක් ලෙස 2025 පාර්ලිමේන්තු මැතිවරණය තෙක් ධූරය දැරීමට වත්මන් ජනාධිපතිවරයාට හැකියාවක් ඇති බවටද මතයක් ගොඩනැගී ඇත. එසේ වුවත් ඒ මගින් වක්‍රාකාරයට ජනාධිපතිවරණය කල් දැමීමක් සිදුවන බැවින් ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කිරීමේ හැකියාව ඇත. කුමන හෝ ආකාරයකට ජනමත විචාරණයක් පැවැත්වුවද එය පරාජයට පත්වීම මගින් ජනාධිපතිවරයා බලයට ගෙන ඒමට මුල් වූ බලවේගවල අපේක්ෂාවන් අනතුරට ලක්වේ. උදය ගම්මන්පිල මන්ත්‍රීවරයාට අනුව ජනමත විචාරණයකින් පරාජයට පත්වුවද ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කිරීම මගින් යම් කාලයක් ජනාධිපති ධූරයේ එල්ලී සිටීමට වර්තමාන ජනාධිපතිවරයාට අවකාශය ඇත. එහෙත් එවැනි උත්සාහයක් මගින්ද එතුමාගේ ස්වාමිවරුන්ගේ මූලික අරමුණු අභියෝගයට ලක්වේ.

## ජනපති රනිල්ට බාරදී ඇති කොන්ත්‍රාත්තුව

ඊට හේතුව ජනවරමක් නොමැති වර්තමාන ජනාධිපතිවරයා බලයට ගෙන ඒමට මුල් වූ ඔහුගේ ස්වාමිවරුන්ගේ භූ දේශපාලන න්‍යාය පත්‍රයට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කර ගැනීම සඳහා ඔහු ප්‍රජාතන්ත්‍රවාදීව බලය හොබවන බව ලෝකයට පෙන්වීම අත්‍යවශ්‍ය මූලික කොන්දේසියක් වීමය. ඒ අනුව ජනාධිපතිවරයාට සහ ඔහුගේ ස්වාමිවරුන්ට වඩා සුදුසු වන්නේ ජනාධිපතිවරණය නිසි කලට පවත්වා එය දිනා ගැනීම බව ඉතා පැහැදිලිය. එම තත්ත්වය තුළ ඉදිරි මාස කිහිපය අවසානයේදී ජනාධිපතිවරයා සහ විපක්ෂ නායකවරයා අතර පවතින විරෝධය සමනය කිරීමට ඇමරිකානු තානාපතිනිය සමත් වුවහොත් ව්‍යවස්ථා සංශෝධන හෝ ජනමත විචාරණ අවශ්‍ය නොවන බවට කිසිදු සැකයක් නැත. එහෙත් සාමාන්‍ය ව්වහාරයට අනුව රනිල් - සජිත් ගැටුම සමනය කිරීම යනු අහස සහ පොළොව එකට ගැට ගැසීම වැනි උත්සාහයක් බවට විවාදයක් නැත. ඒ අනුව එදා 2003 දී රනිල් චන්ද්‍රිකා ගැටුම සමනය කිරීමට නොහැකි වීම නිසා නොවේජියානු බෙදුම්වාදී මෙහෙයුම අසාර්ථක වීම පිළිබඳ අධ්‍යයන වාර්තාව නැවත කියවීමේදී වික්ටෝරියා නුලන්ලා සහ අජිත් ඩොවාල්ලා ''අහස පොළොව ගැට ගැසීමේ'' උත්සාහය අත් නොහරින බව ඉතා හොඳින් පැහැදිලි වේ.

## සාමයේ ඉත්තෝ මගින් හෙළිකරන සත්‍යය

එදා 2003දී නොවේජියානු සාම ක්‍රියාවලිය තුළ ජාත්‍යන්තර මැදිහත්වීම සහිතව සටන් විරාම ගිවිසුමක් අත්සන් කළ අතර ඊට අනුව ඊළඟ පියවර වූයේ අන්තර් කාලීන තාවකාලික ආණ්ඩුවක් ප්‍රභාකරන්ට පිරිනැමීමය. එම සැලසුම නොවේජියානුවන් විසින් සූඩානයට ඉදිරිපත් කළ සැලසුමේ කාබන් කොපියකි. එම සූක්ෂම සැලසුමට අනුව සූඩානය බෙදා වෙන් කිරීමට හැකි වූ අතර අද එම රටවැසියන් බල්ලන් බළලුන්සේ එකිනෙකා මරාගනිති. ශ්‍රී ලංකාවේ නළලේ කෙටූ එම ඉරණම වෙනස් කලේ කෙසේදැයි නොවේජියානුවන් ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදීන්ට දැනගැනීමට අවශ්‍ය විය. ඒ අනුව නොවේජයානු ආධාර සංවිධානයේ අරමුදල් යොදවා ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පෙරදිග අධ්‍යන අංශයේ මහාචාර්යවරුන් පස්දෙනකු මගින් අධ්‍යයනයක් සිදුකරනු ලැබීය. එම අධ්‍යයනයේ වාර්තාව සාමයේ ඉත්තෝ **(Pawns of Pease)** ලෙස 2010 දී එළිදැක්විනි.

## 2003 දී ජවිපෙ විසින් ඉටු කළ ජාතිකවාදී භූමිකාව

එම අධ්‍යයන වාර්තාව මගින් එසේ ඔවුන්ගේ සැලසුම අසාර්ථක වීමට අදාළව ප්‍රධාන හේතු හතරක් හඳුනාගනු ලැබීය. පළමුවැනි රාජ්‍ය නොවන සංවිධාන විසින් මුදල් ලබා ගත්තද ඔවුනට බාරදුන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ඔවුන් අසමත්වීමය. දෙවැන්න කුඩා කේඩර්ය පක්ෂයක් වූ ජනතා විමුක්ති පෙරමුණ සෝමවංශ අමරසිංහගේ වචනවලට අනුව රතු කොඩිය හකුලා සිංහ කොඩිය එසවීම මගින් ජාතික බලවේග අවදිකොට බෙදුම්වාදී න්‍යාය පත්‍රයට එරෙහිව ජාතික මට්ටමින් මහා විරෝධයක් ගොඩනැගීමය. තුන්වැන්න හෙළ උරුමය පක්ෂය බෞද්ධ භික්ෂූන් දේශපාලනයට කැඳවා භික්ෂූන් අතර ප්‍රබෝධයක් ඇති කිරීම මගින් ජනතා විමුක්ති පෙරමුණේ පරිවර්තනය තවදුරටත් ශක්තිමත් කිරීමය. හතරවැන්න රනිල් චන්ද්‍රිකා ගැටුම සමනය කිරීමට ජාත්‍යන්තර බලවේග අසමත් වීමය.

## වැරදි නිවැරදි කළ හැටි

ඉහත සඳහන් කළ ආකාරයට අදාල අධ්‍යන වාර්තාව නැවත කියවීමේදී පැහැදිලි වන්නේ ඔවුන් හඳුනාගත් වැරදි හතර අතරින් තුනක් නිවැරදි කිරීමට කිසියම් හෝ බලවේගයක් සමත් වී ඇති බවය. එහිදී වැරදි නිවැරදි කිරීම අවශ්‍ය වන්නේ මූලික අරමුණු ජය ගැනීම හෙවත් බෙදුම්වාදී න්‍යාය පත්‍රයට නැවත පණ දීම සඳහා බව තේරුම් ගැනීමද වැදගත් වේ. මේ වන විට පළමු වරද ඉතා සූක්ෂම ලෙස නිවැරදි කිරීමට අදාළ බලවේග සමත් වී ඇති බව පැහැදිලිව දැකගත හැක. රාජ්‍ය නොවන සංවිධාන ජාලය ජාතික බලවේග සමග ගැටීම වෙනුවට ජාතික බලවේගවල යම් නියෝජිතයින් තම වලිගය බවට පත් කර ගැනීමට මේ වන විට සමත් වී ඇත. ඔවුන් විසින් එන්ගේජ් ලෙස හඳුන්වන එම ක්‍රියාවලිය තුළ හිමාලයා ප්‍රකාශය වැනි බෙදුම්වාදී ප්‍රචාරක ලියවිල්ලකට භික්ෂූන් හත් නමකගේ අත්සන් ගැනීමට ඔවුන් සමත් වී ඇත.

## ජවිපෙට මඟ වැරද්දවීම සහ රනිල් සජිත් කසාදය

දෙවන වරද නිවැරදි කිරීම හෙවත් ජනතා විමුක්ති පෙරමණ ජාතික මතවාදයෙන් ගලවා ගැනීම ඔවුන් අපේක්ෂා කළ ආකාරයට වඩා පහසු වී ඇති බව දැක ගත හැක. නොවේජියානු වාර්තාව එළිදැක්වීමට පෙර 2008 දී පිළිසිඳගත් එම ක්‍රියාවලිය සෝමවංශ අමරසිංහ පිටුවහල් කිරීම සමග ආරම්භ වී අද ජාතික ජන බලවේගයේ බිහිවීමත් සමඟ කූඨප්‍රාප්තියට පත්වී ඇති බව ඉතා පැහැදිලිය. තුන්වැන්න හෙවත් හෙළ උරුමයට සහ එහි නායකයන්ට සිදුවී ඇති දේ පිළිබඳව කතා කිරීම යනු කාලය නාස්ති කිරීමකි. ඒ අනුව ඉතිරි වී ඇති හතරවන වරද නිවැරදි කිරීම හෙවත් අද යුගයට අදාලව රනිල් - සජිත් ගැටුම සමනය කිරීම සඳහා අදාළ බලවේග විසින් උපරිම ප්‍රමුඛතාවය ලබාදෙන බවට කිසිදු සැකයක් නැත. ඒ පිළිබඳව සැක පහළ කරන අය සැක පහළ කරන අයට එසේ කළ හැක්කේ එහෙම දුෂ්කර අභ්‍යාසයට ඔවුන් මුහුණ දෙන ආකාරය පිළිබඳව පමණි

## අවසානයේදී සිදුවන්නේ කුමක්ද?

ජාතික බලවේගවල දීර්ඝකාලීන දේශපාලන අත්දැකීම් අනුව රටට හතුරු බලවේග මෙවර වරදවා ගන්නේ නැත. ඒ නිසා සතුරාගේ පැත්තෙන් බලන විට වඩා සුදුසු වන්නේ පළමුව එක් පැත්තකින් රනිල් සාධකයේ බලය වර්ධනය කර පෙන්වන අතර අනෙක් පැත්තෙන් සජිත් සාධකයේ බලය යටින් දුර්වල කිරීමය. දෙවනුව සජිත් සාධකයට වීරයා වීමට හෙවත් කොන්දේසි පැනවීමට ඉඩ ලබාදීමය. තුන්වැන්න රනිල් සාධකය ''බෝධිසත්වකරණය'' කිරීම හෙවත් නිර්පාක්ෂික අපේක්ෂකයා ලෙස සජිත්ට උඩින් සමාව දී යටින් යටත් වීමය. ඒ තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර අගමැති පුටුව සජිත් සාධකයට පිරිනැමීමටද එකඟ විය හැක. එසේ වුවත් ඒ සියල්ල සිදුවන්නේ අවසාන මොහොතේදී බවද ඉතා පැහැදිලිය. ඊට හේතුව සජිත් සාධකය විසින් දේශපාලන වේදිකාවේ ඉඩ වෙන්කරගෙන සිටීම මගින් ජාතිකවාදී පොදු අපේක්ෂකයෙකු වේදිකාවට කඩා වැදීම වැළැක්වීමද මෙම මෙහෙයුමේ පූර්ව කොන්දේසියක් වීමය. ඒ අනුව අවසාන මොහොතේදී පුළුල් එකඟතාවයකින් තොරව එවැනි අපේක්ෂකයෙකු කැඳවුවහොත් සෙසු සියළු බලවේගවලට හිමිවන්නේ ඡන්ද කැඩීමේ භූමිකාව මගින් රනිල් - සජිත් භූමිකාව ශක්තිමත් කිරීමය.

අවසාන වශයෙන් අන්තිම මොහොත දක්වා රටට හතුරු සහ මිතුරු වශයෙන් සමාජය ධ්‍රැවීකරණය වීම වැළැක්වීම සඳහා පවතින තත්ත්වය එසේම පවත්වාගෙන යාමට සහ විවිධ උපකල්පන ඉදිරිපත් කරමින් මහජනයා වික්ෂිප්ත කිරීමට ද ජනාධිපතිවරයා කටයුතු කරන බව ඉතා පැහැදිලිය. ඒ අනුව ජනාධිපතිවරණය කල්දැමීම සහ ජනමත විචාරණයක් පැවැත්වීම ආදී විකල්ප ඉදිරිපත් කිරීමට අමතරව ජනාධිපතිවරණයට පෙර පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම වැනි උපකල්පන ද ඉදිරිපත් වේ. එහෙත් ව්‍යවස්ථාවට සහ නීතියට අනුව සැප්තැම්බර් මාසය වන විට ජනාධිපතිවරණය කැඳවීමට සිදුවන අතර සියලු බලවේගවලට ඊට මුහුණ දීමට සිදුවනු ඇත. කෙසේවෙතත් දෙවන අරගලයක් කැඳවීම මගින් මර්ධනකාරී වාතාවරණයක් තුළ මැතිවරණය පැවැත්වීමේ ඉඩකඩ බැහැර කල නොහැක.

**දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය**

**2024-03-01**